**ශීර්ෂය 228 - අධිකරණ පරිපාලනය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අධිකරණ පරිපාලනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 30 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 20 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරිවෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අධිකරණ පරිපාලනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධානගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍යප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **අක් මුදල් ගැළපුම් ගිණුම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව පැවති රු.200,405,660 ක් හා රු.26,841,142 ක් වූ නොපිය වූ උප අග්‍රිම ශේෂයන් දෙකක් සමාලෝචිත වර්ෂය තුළදී පියවා තිබුණු නමුත් ඒ පිළිබඳ තොරතුරු සමාලෝචිත වර්ෂයේ අග්‍රිම ගිණුමේ දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේදී නිරවුල් කර ඇති මෙම අග්‍රිම ශේෂයන් අතපසු වීමකින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ACA 03 ආකෘතියට ඇතුළත් කිරීමට නොහැකිවීඇත. | උප අග්‍රිම ශේෂ පියවීම පිළිබඳව තොරතුරු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කළ යුතු වේ. |

**1.6.2** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අවසාන ශේෂයන්, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ඇතුළත් කිරීමේදී රු.950,444,894 ක වෙනසක් පැවතුණි. | මෙම වෙනසට හේතු වී ඇත්තේ සමාලෝචිත වර්ෂයේ තක්සේරු කරන ලද වත්කම්වල වටිනාකම් ආරම්භක ශේෂ ලෙස ඇතුලත් කිරීමත්, ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගෙන අනෙකුත් අධිකරණ වෙත නිකුත් කරනු ලබන වත්කම් ප්‍රධාන කාර්යාලයේ සිගාස් වැඩසටහනෙන් ඉවත් කර අදාල මහාධිකරණයේ ආරම්භක ශේෂ ලෙස සිගාස් වැඩ සටහනට ඇතුළත් කිරීමත්ය. | ඉකුත් වර්ෂයේ වත්කම් අවසාන ශේෂයන්, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳී තිබිය යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ ශේෂය රු.6,399,989,032 ක් වුවද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු.6,396,228,605 ක් වූයෙන් දේපළ පිරියත හා උපකරණ වටිනාකම හා දේපළ පිරියත හා උපකරණ සංචිතය රු.3,760,427 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වාකරේ අධිකරණය ඉදිකිරීමට අදාලව ගෙවන ලද එම වටිනාකම CIGAS වැඩ සටහනෙහි වත්කම් අගයට එකතු කිරීමේදී සිදු වූ පද්ධති දෝෂයක් හේතුවෙන් එය භාණ්ඩාගාර සටහන් වලට එකතු නොවීම මත මෙම වෙනස සිදු වී ඇති අතර එය කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට යන්ත්‍ර හා උපකරණ ශේෂය රු.1,190,923,305 ක් වුවද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු.1,167,226,396 ක් වූයෙන් දේපල පිරියත හා උපකරණ ශේෂය සහ දේපල පිරියත හා උපකරණ සංචිතය රු.23,696,909 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම් අගය CIGAS Interface හි උඩුගත කිරීමේදී මෙම වෙනස සිදුවී ඇති අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර ගිණුම් සමඟ සසඳා නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුවේ. |

### 1.6.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට කේවල ණය ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව සහ පාලන ගිණුමේ ශේෂය අතර රු.12,536,427 ක වෙනසක් පැවතුණි. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය හා පාලන ගිණුම අතර පවතින මෙම නොසැසඳීම 90 දශකයේ සිට පැවත එන්නකි. මහාධිකරණ කළාප අතර අභ්‍යන්තර ස්ථාන මාරු වීම් යටතේ ණය ශේෂ නිරවුල් කර ගැනීමේදී මෙම දෝෂය ඇති වී ඇති අතර එය නිරවුල් කිරීමට කටයුතු කර අමාත්‍යාංශය වෙත වාර්තා කරන ලෙස කලාප ගණකාධිකාරීන්ට උපදෙස් ලබාදී ඇති අතර එහි ප්‍රගතිය අමාත්‍යාංශය මගින් වරින් වර පරීක්ෂා කරනු ලැබේ. | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය හා සමාන විය යුතු වේ. |

### 1.6.4 වෙනත් අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ ඇතුළත් ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක 2020 ජනවාරි 01 දිනට අයකර ගතයුතු රු.4,240,412 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන තිබුණද එම අයකර ගැනීම සහ ඉදිකිරීම් ව්‍යාපෘති 04 කට අදාලව 2020 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු රු.17,689,394 ක කුලී අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2018 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවෙන් මේ සම්බන්ධව විමසීමෙන් පසු ආරම්භ කරන ලද සියළුම ව්‍යාපෘතිවල අත්තිකාරම් රා.ගි.ච 250/2016(1) හි 3 හා 4 ඡේද අනුව ගිණුම්ගත කර ඇත. විගණන විමසුමට පෙර මෙම ව්‍යාපෘති සඳහා අත්තිකාරම් ලබාදී තිබූ බැවින්ද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සඳහා සංචිත ගිණුම් ආරම්භ කර නොමැති බැවින්ද මෙම අය කර ගැනීම් සහ අයකර ගතයුතු ශේෂ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොමැත. | 2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016(1) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් පිළිබඳ නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වැය විෂයන් 05 ක් සඳහා ලබාදී තිබූ රු.41,420,000 ක අමතර ප්‍රතිපාදනයෙන් රු.24,379,798 ක් උපයෝජනයකර නොතිබුණි. | ්කොවිඩ් ව්‍යවසනය හේතුවෙන් වර්ෂ අවසානයේ අධිකරණයන්හි කටයුතු නිසි පරිදි සිදු නොවීම නිසා අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම නිසා වැය විෂයයන් 04 ක ප්‍රතිපාදනද , වර්ෂ අවසානයේ රාජ්‍ය දැව සංස්ථාව වෙතින් නියමිත දිනට ගෘහ භාණ්ඩ ලබා ගැනීමට නොහැකි වීම නිසාද එක් වැය විෂයයක ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු අතර සැලසුමකට අනුව අමතර ප්‍රතිපාදන ලබාගත යුතුවේ. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල බැරකම්වල වටිනාකම රු.756,032 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රජයේ කර්මාන්ත ශාලාවට ගෙවිය යුතු රු.756,032 ක මුදල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අතපසු වීමකින් අත්හැරී ගොස් ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුවේ. |
| (ආ) | වැය විෂයන් 04 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය අඩු කළ පසු ඉතිරිය ඉක්මවා රු.10,412,631 ක බැරකම් වලට එළඹ තිබුණි. | කොවිඩ් ව්‍යවසනය හේතුවෙන් රට විවෘත කිරීමත් සමඟ සති අන්තයේ හා නිවාඩු දිනවල සේවය කිරීමට සිදු වීමත් වර්ෂ අවසානයේ ගිණුම් පියවීමේ කටයුතු හේතුවෙන් නිලධාරීන් අතිකාල සේවයේ යොදවා ගැනීමට සිදු වීමත්, නඩු කටයුතු කඩිනම් කිරීම හේතුවෙන් සිතාසි බෙදන්නන්ගේ ගමන් වියදම් ඉහල යාම, ඡායා පිටපත් යන්ත්‍ර,ෆැක්ස් යන්ත්‍ර, ඩුප්ලෝ යන්ත්‍ර අළුත්වැඩියාව, කොවිඩ් ව්‍යවසනය හේතුවෙන් සනීපාරක්ෂක වියදම් ඉහළ යාම හේතුවෙන් වැය විෂයයන් 04 සඳහා බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 109 (1) හා (2) | 3,093,666 | වසර 02 සිට 10 දක්වා කාලයක් තුළ අවස්ථා 63 කදී සිදුවී තිබූ අලාභයන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන වාහන අනතුරු ඇතුළු අනෙකුත් අලාභ හානි සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව නිසි පරිදි කටයුතු කරන අතර විගණන විමසුමේ සඳහන් අලාභ හානි වර්ෂ | මුදල් රෙගුලාසි 109<br>(1) හා (2) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | | ගණනාවක් පැරණි වන අතර පවතින ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට කටයුතු කර ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සැසඳුම් ප්‍රකාශ අනුව එකතුව රු.28,746,312 ක් වූ හිඟ ණය ශේෂයෙන් වසර 05 කට වැඩි කාලයක් ගත වූ ණය ශේෂවල වටිනාකම රු.7,633,491 ක් වූ අතර එය මුළු හිඟ ණය ශේෂයන්ගෙන් සියයට 26 ක් විය. | 1990 දශකයේ සිට අය නොවී පවතින ණය ශේෂ වල වටිනාකම රු.7,633,491 සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා ණය ගොනු, පුද්ගලික ලිපිනයන්, ජාතික හැඳුනුම්පත් අංක යනාදී තොරතුරු අධිකරණ සතුව නොමැති බැවින් මෙකී ණය ශේෂ කපා හැරීමටද අසීරු වී ඇත. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. |
| (ආ) | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.10,313,832 ක ණය ශේෂයක් විය. ඉන් රු.145,820 ක ණය වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු රු.10,313,832 ක ණය ශේෂයෙන් රු.1,170,900 ක් 2021.03.31 දිනට නිරවුල් කරගෙන ඇති අතර ඉතිරි ණය ශේෂයන්ද නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. විශ්‍රාම ගන්නා හෝ මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඔවුන්ගේ ගිණුම් සාරාංශයෙන් නිරවුල් කරන බවට උපදෙස් ලබාදී තිබුණද අධිකරණ පරිපාලන ශීර්ෂයට අදාළව එම නව ක්‍රමය යටතේ මෙතෙක් විශ්‍රාමික නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කර නොමැත. මෙම කටයුතුවල යම් අඩාල වීමක් ඇති බැවින් පෙර පරිදි මාසික ගිණුම් සාරාංශ හරහා ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් පසුව දන්වා ඇත. | අය නොවූ ණය ශේෂ අයකර ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 7.2.5 වගන්තියට පටහැනිව පෙර ලබාගත් බයිසිකල් ණය සම්පූර්ණයෙන්ම අයකර ගැනීමකින් තොරව කොළඹ මහාධිකරණ කළාපයේ නිලධාරියෙකුට මෝටර් රථ ණයක් ලබාදී තිබූ අතර පසුව ඔහුගේ වැඩ තහනම් කර තිබුණි. එමනිසා ලබාගත් මෝටර් රථ ණය රු.107,000 ක් සහ බයිසිකල් ණය රු.3,800 ක් වසර 05 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. | මේ සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණයෙන් විමසීම් කළ අතර ලිපි ගොනු පරීක්ෂාවේදී එම නිලධාරියා සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් සොයාගත නොහැකි වූ බැවින් තවදුරටත් මේ සම්බන්ධයෙන් සොයා බලා ඉදිරි කටයුතු සිදු කරන බව 2021.04.09 දිනැති අංක කො/මහාධි/ගි/අත්ති බී/2021 ලිපිය මගින් දන්වා ඇත. | අත්තිකාරම් ගෙවීමේදී ආයතන සංග්‍රහය ප්‍රකාරව අය නොවූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 2.5 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකරණ කළාප 26 ක තැන්පතු ගිණුම් 593 ක රු.10,090,396,580 ක ශේෂයන් සහ කම්කරු විනිශ්චය සභාවේ තැන්පත් ගිණුම් 04 ක රු.1,821,214 ක ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අධිකරණ කලාපවලට අදාලව විශාල තැන්පතු ප්‍රමාණයක් පවතින බැවින් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම ප්‍රායෝගිකව අපහසු වන වන අතර ප්‍රධාන කාර්යාලය සඳහා පමණක් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත. | මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට ප්‍රධාන කාර්යාලය සහ මහාධිකරණ කළාප 23 කට අයත් බැංකු ගිණුම් 48 ක බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු.2,813,441 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විමසුමෙන් පෙන්වාදී ඇති අධිකරණ කලාපයන්හි මාස 06 ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් 396 අනුව කටයුතු කරන ලෙසට අදාල අධිකරණයන් වෙත උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ආරම්භ නොකළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කන්තලේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම සඳහා වෙන් කල රු.5,000,000 ක ප්‍රතිපාදන කොන්ත්‍රාත්කරුවකු තෝරා නොගැනීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | 2020 වර්ෂය තුළ රට තුළ ඇතිව තිබූ කොරෝනා වසංගතය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට නොහැකි වූ අතර මේ වන විට මෙම ව්‍යාපෘතියට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින අතර මෙම වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. | සැලසුම්වලට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුවේ. |

## 3.2 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පූගොඩ දිසා මහේස්ත්‍රාත් අධිකරණ නව ගොඩනැඟිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2019 ජනවාරි මැද භාගයේ ආරම්භ කළ යුතුව තිබුණි. එහෙත් ව්‍යාපෘතියේ මූලික වියදම් ඇස්තමේන්තුව රු.449,730,984 කට 2019 පෙබරවාරි 25 දින නැවත සකස් කිරීම, වාස්තු විද්‍යාත්මක සැලැස්ම 2019 අප්‍රේල් 05 දින නැවත අනුමත කිරීම හේතුවෙන් මාස 09 ක් ප්‍රමාද වී 2019 සැප්තැම්බර් 22 දින වැඩ ආරම්භ කර තිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ රු.මිලියන 450 ක ඇස්තමේන්තුගත මුදලට ඇතුළත් කර නොතිබූ නවීන තාක්ෂණික උපාංග ඇතුළත් කර රුපියල් මිලියන 610 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර 2018 දෙසැම්බර් 28 කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. පසුව නවීන තාක්ෂණික උපාංග ඉවත් කර සිවිල් ඉදිකිරීම් සඳහා පමණක් රුපියල් මිලියන 429 කට මූලික වියදම් ඇස්තමේන්තුව සකස් කර පෙර කොන්ත්‍රාත් ප්‍රදාන ලිපියේ වටිනාකම සංශෝධනය කර 2019 ජූලි 26 දින ආයතනය වෙත දන්වා ඇත. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කර කාල පමාවකින් තොරව ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුවේ. |

**3.3 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බදු ගිවිසුම් ප්‍රකාරව පූගොඩ දිසා / මහේස්ත්‍රාත් අධිකරණය පවත්වාගෙන යාම සඳහා මාසික කුලිය රු.400,000 කට ලබාගත් තාවකාලික ගොඩනැඟිල්ල අදාළ කාර්යයට භාවිතා නොකර රු.6,400,000 ක් බදු කුලී ලෙස ගෙවා තිබුණි. නව අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම නියමිත කාලය තුළ සිදු නොකිරීම නිසා මෙහි බදු කාලය 2021 ජනවාරි 31 සිට 2022 ජූලි 20 දින දක්වා දීර්ඝ කර තිබුණි | පූගොඩ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය පවත්වා ගෙනයාම සඳහා ලබා ගත් තාවකාලික ගොඩනැගිල්ල ඒ ආකාරයෙන්ම අධිකරණයක් සඳහා යොදා ගත නොහැකි බැවින් අධිකරණය පවත්වා ගෙනයාම සඳහා සුදුසු ආකාරයට අවශ්‍ය වෙනස්කම් කළයුතු අතර එම වෙනස්කම් සිදු කල හැක්කේ ගොඩනැඟිල්ල කුලියට ලබාගත් පසු වේ. අධිකරණයට ගැළපෙන අයුරින් කුලී ගොඩනැඟිල්ල වෙනස් කිරීමට කාලයක් ගත වූ අතර එම කාලය සඳහා බදු කුලී ගෙවීමට සිදු විය. | සකසුරුවම්භාවයෙන් වියදම් කළමනාකරණය කළ යුතුවේ. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට වැය ශීර්ෂය 228 ( අධිකරණ පරිපාලනය) ට අයත් අධිකරණ අමාත්‍යාංශය මගින් පත්වීම් කරනු ලබන තනතුරු 09 කට අදාළව පුරප්පාඩු සංඛ්‍යාව 522 ක් වූ අතර අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්වීම් කරනු ලබන තනතුරු 08 කට අදාල පුරප්පාඩු 874 ක් විය. | අධිකරණ අමාත්‍යාංශය මඟින් පත්වීම් සිදු කරනු ලබන තනතුරුවලට අදාළව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, භාෂා පරිවර්තක සේවය හා සංවර්ධන නිලධාරී සේවයේ තනතුරුවල පුරප්පාඩු පිළිබඳ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇති අතර සංවර්ධන නිලධාරී නවක පත්වීම් මඟින් අධිකරණවල පවතින පුරප්පාඩු 06ක් සඳහා නිලධාරීන් පත් කර ඇත.ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු සඳහා බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇති අතර කාර්යාල කාර්ය සහායක තනතුරු 132 ක් සහ අධිකරණ ආරක්ෂක තනතුරු 48 ක් සඳහා එම දෙපාර්තමේන්තුව මඟින් පත් කිරීම් සිදු කර ඇත. | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. |